මාධ්‍ය නිවේදන අංක 01

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (3 අදියර)
## නාම යෝජනා භාර ගැනීම

අංක 1699/35 හා 2011 මාර්තු මස 30 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් නිල කාලය දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දීර්ඝ කරන ලද පහත සඳහන් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අදාල තේරීම්භාර නිලධාරීන් විසින් 2011.08.04 දිනෙන් යුතුව නාමයෝජනා දැන්වීම ප්‍රකාශයට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම පළාත් පාලන ආයතන සඳහා නාමයෝජනා භාර ගැනීම අදාල තේරීම්භාර නිලධාරීන් විසින් 2011.08.18 වැනි දින සිට 2011.08.25 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා කාර්යාල වේලාවන් තුල අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී සිදු කරනු ලැබේ. නාමයෝජනා භාරදීමට අපේක්ෂා කරනු ලබන ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් 2011.08.24 වැනි දින මධ්‍යාහ්න 12.00 ට පෙර අදාල කණ්ඩායම් නායක විසින් හෝ ඔහු විසින් බලය පැවරූ අයකු විසින් අදාල තේරීම්භාර නිලධාරී වෙත ඇප මුදල් භාර දී කුවිතාන්සියක් ලබා ගත යුතුය.එක් එක් අපේක්ෂකයකු වෙනුවෙන් භාර දිය යුතු ඇප මුදල රු.250 ක් වේ.

නාමයෝජනා භාර ගැනීමට නියමිත පළාත් පාලන ආයතන පහත දක්වා ඇත.

| පරිපාලන දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතනය | පරිපාලන දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතනය |
|---|---|---|---|
| කොළඹ | කොළඹ මහ නගර සභාව | නුවරඑළිය | නුවරඑළිය මහ නගර සභාව |
| | දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව | ගාල්ල | ගාල්ල මහ නගර සභාව |
| | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | මාතර | මාතර මහ නගර සභාව |
| | මොරටුව මහ නගර සභාව | හම්බන්තොට | හම්බන්තොට මහ නගර සභාව |
| | කොලොන්නාව නගර සභාව | | සූරියවැව ප්‍රාදේශීය සභාව |
| | කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව | | හම්බන්තොට ප්‍රාදේශීය සභාව |
| ගම්පහ | මීගමුව මහ නගර සභාව | අම්පාර | කල්මුනේ මහ නගර සභාව |
| | ගම්පහ මහ නගර සභාව | කුරුණෑගල | කුරුණෑගල මහ නගර සභාව |
| මහනුවර | මහනුවර මහ නගර සභාව | අනුරාධපුර | අනුරාධපුර මහ නගර සභාව |
| | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව | බදුල්ල | බදුල්ල මහ නගර සභාව |
| | මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව | රත්නපුර | රත්නපුර මහ නගර සභාව |
| මාතලේ | මාතලේ මහ නගර සභාව | | |

මෙ අනුව නාමයෝජනා භාර ගනු ලබන පළාත් පාලන ආයතන සංඛ්‍යාව 23 කි.

| | |
|---|---|
| මහ නගර සභා | 17 |
| නගර සභා | 1 |
| ප්‍රාදේශීය සභා | 5 |
| | 23 |

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.08.04

Ma_media-20110804